සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

7 ශ්‍රේණිය
தரம் 7
Grade 7

පුරවැසි අධ්‍යාපනය I හා II පත්‍රය
வாழ்க்கைத் தேர்ச்சியும் குடியுரிமையியல் வினாத்தாள்- I-II
Citizenship education Paper I & II

පැය දෙකයි
இரண்டு மணித்தியாலங்கள்
Two Hours

නම/විභාග අංකය :- ..........................................................................................................

## I කොටස

උපදෙස්

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 20 කින් සමන්විතයි.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්න වලට මෙම ප්‍රශ්න පත්‍රයේම් පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. වර්තමාන සමාජයේ සුලබව දැකිය හැකි පවුල් ඒකකය වන්නේ

A. විස්තෘත පවුල
B. න්‍යෂ්ටික පවුල
C. විශාල පවුල
D. කුඩා පවුල

02. දරුවා මුලින්ම අන්තර් පුද්ගල සම්බන්ධතා ආරම්භ කරන්නේ,

A. සමාජය තුළය
B. පවුල තුළය
C. පාසල තුළය
D. අසල්වැසියන් සමගය

03. ආත්මාභිමානය ලෙස හැඳින්වෙන්නේ,

A. ඔබ සතු උසස් ගුණාංගය
B. ඔබගේ හැකියාවන්ය
C. ඔබ සතු දක්ෂතාවයන්ය
D. ඔබේ උසස් ගුණාංග සෙසු අය අගය කරන විට දැනෙන හැඟීමය

04. ඔබගේ ජීවිත අරමුණ කරා ඔබව රැගෙන යන්නේ,

A. අධ්‍යාපනයයි
B. යහපත් අරමුණුය
C. මුදල්ය
D. දෙමාපියන්ය

05. පාසල් ශිෂ්‍යයකුගේ අරමුණු විය යුත්තේ,

A. හොඳ රැකියාවක් කිරීමයි.
B. පවුලේ සාමාජිකයින් රැකබලා ගැනීමයි.
C. හොඳින් විභාග සමත් වීමයි.
D. ඉහළ ආදායමක් ඉපැයීමයි.

❖ අංක 6 සිට 10 දක්වා වගන්ති හරිනම් (√) ලකුණද වැරදිනම් (X) ලකුණද යොදන්න.

06. ශක්තිමත් සමාජ පදනමක් ඇති වන්නේ පවුල් අතර යහපත් අන්තර් සම්බන්ධතාවයක් බිහිවීම තුළිනි. (..........)

07. එදිනෙදා ජීවිතයේ අප මුහුණ දෙන විවිධ බාධාවන් අභියෝග ලෙස සැලකේ. (..........)

08. කාල සටහනට අනුව වැඩ කිරීමෙන් අපගේ අරමුණු කරා යාමට නොහැකි වේ. (..........)

09. සෑම පවුලකම දැකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ විශාල සාමාජිකයන් සංඛ්‍යාවක් සිටීමයි. (..........)

10. පුද්ගලයකුගේ කටහඬ ඔහුගේ අනන්‍යතාවය හඳුනාගත හැකි සාධකයකි. (..........)

❖ අංක 11 සිට 16 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය වරහන තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

**(චිත්ත පීඩා/ස්වයංවිනය/දේශපාලන/විවේක කාලය/ආදායම/යහපත් සිතුවිලි)**

11. ලැබෙන .................................. ප්‍රමාණවත් නොවීම වර්තමාන සමාජයේ බොහෝ පවුල් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවකි.

12. ආගමික කටයුතු වල නිරතවීම .......................................... පාලනය කිරීමට ඇති හිතකර ක්‍රමයකි.

13. යහපත් පුද්ගලයකු සතු හොඳ ගුණාංගයකි........................................................

14. තමන් කැමති පක්ෂයකට හෝ පුද්ගලයකුට ඡන්දය ප්‍රකාශ කිරීම පුද්ගලයකුගේ ..................................අයිතියකි.

15. ඕනෑම පුද්ගලයකු නිශ්චිත වැඩක නොයෙදෙන වේලාව ............................................. ලෙස හැඳින්වේ.

❖ අංක 16 සිට 20 දක්වා වාක්‍ය වලට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා එම අක්ෂරය වරහන තුළ ලියන්න.

| A | | | B |
|---|---|---|---|
| 16. පවුලක දැකිය හැකි සම්ප්‍රදායකි | ( ) | A | මානසික අසහනය |
| 17. ජන සමාජය තුළ පවත්නා ස්වේච්ඡා සංවිධානයකි. | ( ) | B | දිවා සුරැකුම් මධ්‍යස්ථානය |
| 18. වර්තමාන සමාජයේ සමහර පුද්ගලයින් මුහුණ දෙන තත්වයකි | ( ) | C | දිනපතා ආගම ඇදහීම |
| 19. කුඩා දරුවන්ගේ සුභසාධනය සලසන ආයතනයකි. | ( ) | D | ග්‍රාම සංවර්ධන සමිතිය |
| 20. ගෝලීය සමාජයම මුහුණ දෙන ප්‍රධාන ගැටළුවකි | ( ) | E | මිහිකත උණුසුම වැඩිවීම |
| | | F | වාණිජ බැංකු |

(ලකුණු 2X20=40)

## II කොටස

❖ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01.

I. පවුලක සිටින සාමාජිකයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 3යි.)

II. වර්තමාන ජන සමාජයේ දැකිය හැකි විවිධ සංවිධාන 4ක් ලියන්න. (ලකුණු 4යි.)

III. එම එක් සංවිධානයකින් ඉටුවන සේවාවන් 2ක් ලියා එකක් විස්තර කරන්න. (ලකුණු 5යි.)

02.

I. අපගේ සිතේ ඇතිවන සරල පීඩාවන් 3ක් ලියන්න. (ලකුණු 3යි.)

II. අයහපත් චිත්ත පීඩා පාලනය කරගැනීමට ඔබට ගතහැකි සරල ක්‍රියා මාර්ග 4ක් ලියන්න. (ලකුණු 4යි.)

III. චිත්ත පීඩා පාලනය කරගැනීමට නොහැකි වීමෙන් මුහුණ දීමට සිදුවන අහිතකර ප්‍රතිඵල 5 ක් ලියන්න. (ලකුණු 5යි.)

03.

I. පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබ මුහුණ දෙන අභියෝග 3ක් සඳහන් කරන්න. (ලකුණු 3යි.)

II. ඔබේ ජීවන අභියෝග සාර්ථක කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග 2ක් ලියන්න. (ලකුණු 4යි.)

III. ජන සමාජයේ යහපත උදෙසා ඔබ විසින් කළ යුතු නීතිමය යුතුකම් 2ක් ද සදාචාරාත්මක යුතුකම් 3ක්ද ලියන්න. (ලකුණු 5යි.)

04.

I. සමාජයේ පවතින අයිතිවාසිකම් වල ලක්ෂණ 3ක් ලියන්න. (ලකුණු 3යි.)

II. පුද්ගලයකුට හිමි සිවිල් අයිතිවාසිකම් 2ක් හා දේශපාලන අයිතිවාසිකම් 2ක් ලියන්න. (ලකුණු 4යි.)

III. සමාජයේ යහපත වෙනුවෙන් ඔබට කළ හැකි යුතුකම් 2 ක් ලියන්න. ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 5යි.)

05.

I. දරුවෙකු මුලින්ම අන්තර් සම්බන්ධතා ඇති කර ගන්නා පුද්ගලයින් 3දෙනෙකු නම් කරන්න. (ලකුණු 3යි.)

II. ජන සමාජයේ දැකිය හැකි අන්තර් සම්බන්ධතා 4 ක් ලියන්න. (ලකුණු 4යි.)

III. ළමුන් මෙහෙකාර සේවයේ යෙදවීමෙන් ඔවුන්ට ඇතිවිය හැකි අයහපත් බලපෑම් 5ක් ලියන්න. (ලකුණු 5යි.)

06.

I. වැඩිහිටි සමාජිකයින් සමාජයේ සෙසු අයගෙන් අපේක්ෂා කරන ගුණාංග 3ක් ලියන්න. (ලකුණු 3යි.)

II. ඕනෑම පවුලක දැකිය හැකි පොදු ලක්ෂණ 4 ක් නම් කරන්න. (ලකුණු 4යි.)

III. විවේක කාලය අර්ථවත්ව ගත කිරීමෙන් ජීවිතයට ලබාගත හැකි ප්‍රයෝජන 5 ක් ලියන්න. (ලකුණු 5යි.)

07.

I. ජන සමාජයේ යහපත් පුරවැසියකු වශයෙන් ජීවත් වීම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග 3 ක් ලියන්න. (ලකුණු 3යි.)

II. ළමා ශ්‍රමිකයින් හා සම්බන්ධ සමාජ වගකීම් 4 ක් ලියන්න. (ලකුණු 4යි.)

III. රාජ්‍ය හා පුද්ගලික අංශයේ සේවයේ නියුතු වෘත්තිකයකුගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා ක්‍රියාත්මක නීති රීති / විධිවිධාන 5 ක් ලියන්න. (ලකුණු 5යි.)

<u>**මුස්ලිම් පාසල් සඳහා උපදෙස්**</u>

❖ **මෙම දෙවන කොටසේ ප්‍රශ්න තෝරා ගැනීමේදී ප්‍රශ්න අංක 8 හා 9 ප්‍රශ්නද පිළිතුරු ලිවීමට තෝරා ගන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5කි.**

08.

I. පුද්ගලයකුගේ අනන්‍යතාවය තහවුරු කිරීමට උදව් වන කරුණු 3 ක් ලියන්න. (ලකුණු 3යි.)

II. පවුලේ සාමාජිකයකු ලෙස වර්ධනය කරගත යුතු යහපත් ගුණාංග 4 ක් ලියන්න. (ලකුණු 4යි.)

III. සමාජයේ යහපතට හේතුවන වෙනත් ආයතන 3ක් නම් කර ඉන් එකකින් ඉටුවන සේවා 2ක් ලියන්න. (ලකුණු 5යි.)

09.

I. ක්‍රීඩා වල යෙදීමෙන් පුද්ගලයකු තුළ වර්ධනය වන ගුණාංග 3ක් සඳහන් කරන්න. (ලකුණු 3යි.)

II. ඇසුරුම් සහිත නිෂ්පාදන වල නිෂ්පාදකයා විසින් අනිවාර්යයෙන්ම මුද්‍රණය කර තිබිය යුතු කරුණු 4 ක් ලියන්න. (ලකුණු 4යි.)

III. රැකියාවක යෙදීමෙන් ප්‍රමාණවත් ආදායමක් ලැබීම නිසා පුද්ගලයකුට ඇතිවන ප්‍රයෝජන 3ක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 5යි.)